# දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු රැස්වීම - අම්පාර
## රැස්වීම් වාර්තාව

01. දිනය - 2023.02.28 වේලාව - පෙ.ව. 9.30

02. ස්ථානය - අම්පාර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයීය ඒ.අයි. වික්‍රම ශ්‍රවණාගාරය

03. ප්‍රධානත්වය - දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු සභාපති දිගාමඩුලු දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු.ඩබ්.ඩී.වීරසිංහ මැතිතුමා

04. මෙහෙයවීම - දිස්ත්‍රික් ලේකම් ජේ.එම්.ඒ. ඩග්ලස් මහතා

05. සහභාගීත්වය - මෙම දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු රැස්වීම සඳහා සහභාගී වූ දේශපාලන අධිකාරිය, නැගෙනහිර පලාත් සභාවේ හා දිස්ත්‍රික්කයේ සියලුම ආයතන නියෝජනය කරමින් පැමිණි නිලධාරින් සහ ආරක්ෂක අංශවල ප්‍රධානීන්ගේ පැමිණීමේ ලේඛනය අමුණා ඇත.(ඇමුණුම I)

**06. පිළිගැනීම හා අරමුණ පැහැදිලි කිරීම.** - දිස්ත්‍රික් ලේකම්/ දිසාපතිතුමන් විසින් දිස්ත්‍රික් සම්බන්ධිකරණ කමිටුව අමතමින්, මුලින්ම පැමිණ සිටි දිස්ත්‍රික් සම්බන්ධිකරණ කමිටු ගරු සභාපතිතුමා, සියළුම ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්, නැගෙනහිර පලාත් සභාවේ ප්‍රධාන ලේකම් ඇතුලු පළාත් සභාව නියෝජනය කරමින් පැමිනි හා දිස්ත්‍රික්කයේ සියලුම ආයතන නියෝජනය කරමින් පැමිණි නිලධාරින් , ගරු නගරාධිපතිවරුන් සහ ප්‍රාදේශිය සභා සභාපතිවරුන් ඉතා සුහදව පිළිගන්නා ලදි. අනතුරුව ගරු. සභාපතිතුමන් වෙත දිස්ත්‍රික් සම්බන්ධිකරණ කමිටුවේ කටයුතු ඉදිරියට ගෙන යාම සඳහා භාර දෙන ලදි.

**07. ජාතික මට්ටමින් ක්‍රියාත්මක වන ප්‍රධාන සංවර්ධන වැඩසටහන් පිළිබඳ ප්‍රගතිය සමාලෝචනය**

**7.1 ග්‍රාමීය ආර්ථික පුනර්ජීවන කේන්ද්‍ර සවිබල ගැන්වීමේ වැඩසටහන**

**i. ආර්ථික සුරක්ෂිතතාව හා පෝෂණය පිළිබඳ ජාතික වැඩසටහන**

දිසාපතිතුමන් විසින් මෙම වැඩසටහන යටතේ දිස්ත්‍රික්කයේ ආහාර සුරක්ෂිතතාව ඇති කිරීම සඳහා ගත් ක්‍රියාමාර්ග පිළිබඳව කෙටියෙන් පැහැදිලි කිරීමක් සිදු කරනු ලැබීය. දිස්ත්‍රික්කය තුල ආහාර සුරක්ෂිතතාවය පිළිබඳ අවදානමක් සහිත පවුල් හඳුනා ගැනීමට හා සුභසාධන ප්‍රතිලාභ ගෙවීම පිණිස සුදුසු තැනැත්තන් හදුනා ගැනීම සඳහා ප්‍රධාන වශයෙන් සමීක්ෂණ 02ක් ග්‍රාම නිලධාරි වසම් මට්ටමින් සිදු කරන බව දිස්ත්‍රික් ලේකම් විසින් පැහැදිලි කරන ලදි. කෘෂිකර්ම ක්ෂේත්‍රයේ සියලුම ආයතන හා ප්‍රාදේශිය ලේකම් කාර්යාල සම්බන්ධ වෙමින් ගෙවතු වගා වැඩසටහන්, නියර වගාව, කමත්වල වගාව, අතරමැදි කන්න වගාව හා සත්ත්ව නිෂ්පාදන ව්‍යාපෘති වැනි විවිධ ව්‍යාපෘති මෙම වැඩසටහන් යටතේ ග්‍රාමීය මට්ටමින් ක්‍රියාත්මක කරන බව දිසාපතිතුමන් විසින් තවදුරටත් පවසන ලදි.

**ii. 2022/23 මහ කන්නයේ සුළු හා මධ්‍ය පරිමාණ වී මෝල් හිමියන්/ සමූපකාර සමිති හරහා වී අස්වැන්න මිලදී ගැනීමේ වැඩසටහන**

2022/23 මහ කන්නයේ වී වගාව හෙක්ටයාර 89000ක වගාකිරීමට බලාපොරොත්තු වුවත් මහකන්නයේ දී වගාකිරීමට හැකියාව ලැබුණුයේ හෙක්ටයාර 81000 ක් පමණක් බව දිසාපතිතුමන් විසින් දන්වන ලදි.තව ද මෙම කන්නයේ දී වී අස්වැන්න ඉහල මට්ටමක පැවතුන බවත් පසුගිය කාලයට සාපේක්ෂව ගොවීන්ගේ මැසිවිලි අඩු වූ බව ද පවසන ලදි. වී රජය මගින් ගොවීන්ගෙන් වී මිලදී ගැනීමේ වැඩසටහනක් ක්‍රියාත්මක කර ඇති බවත් එහි දී අක්කර 1ක් සඳහා වී 1000kg ද අක්කර 2ක් සඳහා වී 2000 kg ද අක්කර 2ට වැඩි නම් 5000 kg ද උපරිමයකට වී මිලදී ගන්නා බවත් ගොවීන්ට රාජ්‍ය බැංකු හරහා මුදල් ගෙවීම සිදු කරන බවත් පවසන ලදි. එමෙන්ම වී වල තෙතමනය 14%ට වඩා අඩු නම් වී සඳහා රු.100/- ක මුදලක් ද 14%- 22% ත් අතර නම් රු.88/-ක මුදලක් ද ගෙවන බව වැඩිදුරටත් පවසන ලදි. එසේ මිලදී ගන්නා වී 1000kgකින් සහල් 650kg ලබා ගැනීමට බලාපොරොත්තු වන බවද එම සහල් හඳුනාගත් සුභසාධන ප්‍රතිලාභී පවුල් වෙත මාස 02ක් සඳහා 10kg බැගින් ලබා දීමට බලාපොරොත්තු වන බව ද පවසන ලදි.

**08. දිස්ත්‍රික් මට්ටමින් ක්‍රියාත්මක සංවර්ධන වැඩසටහන් පිළිබඳ ප්‍රගතිය සමාලෝචනය**

**8.1** දිස්ත්‍රික් ලේකම් කාර්යාලය මගින් ක්‍රියාත්මක වන ව්‍යාපෘති සම්බන්ධව හා ප්‍රගතිය පිළිබඳව කෙටියෙන් පැහැදිලි කිරීමක් සැලසුම් අධ්‍යක්ෂක විසින් සිදු කරන ලදි.

**8.2** නගර සංවර්ධන ව්‍යාපෘති : නියෝජ්‍ය අධ්‍යක්ෂ නාගරික සංවර්ධන අධිකාරි විසින් නගර ව්‍යාපෘති සම්බන්ධ ප්‍රගතිය සභාවට දන්වන ලදි. එහි දී නගර සංවර්ධන ව්‍යාපෘති 9ක් භාරගත් බවත් නගර 100 සංවර්ධන ව්‍යාපෘතිය යටතේ නගර 4 සංවර්ධන ව්‍යාපෘති සාර්ථකව අවසන් කල බවත් එම ව්‍යාපෘති සඳහා ලංකාවෙන් ප්‍රථම ස්ථානය ලබා ගත් බවත් දන්වන ලදි. නින්දවූර් ප්‍රාදේශීය කොට්ඨාසයේ ක්‍රියාත්මක ව්‍යාපෘතියෙන් 95%ක් අවසන් බවත් අනෙකුත් ව්‍යාපෘති සාර්ථකව ක්‍රියාත්මක වෙමින් පවතින බවටත් දන්වන ලදි.

**8.3** අයි- රෝඩ් ව්‍යාපෘතිය - **Integrated Road Development Project:** මෙම ව්‍යාපෘතියේ ව්‍යාපෘතීන්වල වැඩ පසුගිය දෙසැම්බර් මස සිට නවතා ඇති බවත් මාස 6කට පසු නැවත ක්‍රියාත්මක කරන බවත් මාර්ග සංවර්ධන අධිකාරිය මගින් දන්වන ලදි.

**09. දිස්ත්‍රික් සම්බන්ධිකරණ කමිටුවේ අනුමැතිය ලබා ගත යුතු යෝජනා**

| අනු අංකය | යෝජනාව | තීරණය |
|---|---|---|
| 01. | බුද්ධංගල කසල කලමණාකරණ මධ්‍යස්ථානය ක්ලීන් ටෙක් පුද්ගලික ආයතනය මගින් ප්‍රතිසංස්කරණය කිරීමට අනුමැතිය ලබා ගැනීම. | ගිවිසුමේ සඳහන් කොන්දේසිවලට එකඟව අනුමැතිය ලබා දෙන බව දන්වන ලදි.<br>ක්ලීන් ටෙක් පුද්ගලික ආයතනය මගින් අලිවැට සකස්කර දෙන ලෙස කල ඉල්ලීම කඩිනමින් ඉටුකර දෙන ලෙසට වනජීවී දෙපාර්තමේන්තුවටත්, සභාපති නගර සභාව වෙතටත් සභාපති තුමන් විසින් දන්වන ලදි. |
| 02. | LDSP (PT 2) ව්‍යාපෘතිය මහජන උද්‍යානය නවීකරණය වෙනුවෙන් අනුමැතිය ලබා ගැනීම. | අනුමත කරන ලදි. |
| 03. | ලෝක බැංකු ආධාර යටතේ අම්පාර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුල ක්‍රියාත්මක කිරීමට යෝජිත වාරි ව්‍යාපෘති සංවර්ධන යෝජනා සඳහා අනුමැතිය ලබා ගැනීම. | අනුමත කරන ලදි. |
| 04. | ලෝක බැංකු ආධාර යටතේ දමන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුල ක්‍රියාත්මක කිරීමට යෝජිත වාරි ව්‍යාපෘති සංවර්ධන යෝජනා සඳහා අනුමැතිය ලබා ගැනීම. | අනුමත කරන ලදි. |
| 05 | රජය මගින් ඉදිකිරීමට යෝජිතව තිබූ වී හා සහල් මෝල් සඳහා වෙන්කළ නවගම්පුර දයාපුර ප්‍රදේශයේ අක්කර 10 ක ඉඩම අඩු ආදායම් ලාභීන් හා රජයේ සේවකයින් අතරේ බෙදා දීම සඳහා ඉඩම් කච්චේරියක් පැවැත්වීම හා එහි අවම බෙදුම පර්චස් 06 ක් ලෙස සිදු කිරීම. | අනුමත කරන ලදි.<br>රාජ්‍ය නිලධාරීන්, නිවාස ඉල්ලීම සහිත ලේඛනයෙහි සිටින රාජ්‍ය නිලධාරීන්ගේ තම වියදමින් මහල් නිවාසය සාදා ගැනීමට කැමති නම් මෙය සිදු කිරීමට ප්‍රායෝගිකව හැකියාව ඇති බව ද සභාපතිතුමන් විසින් දන්වන ලදි. |
| 06 | හිඟුරාන නගරයේ ව්‍යාපාරික ස්ථාන පුළුල් කිරීම. | අනුමත කරන ලදි. |

10. ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුවට ඉදිරිපත් කර විසඳුම් නොලැබුණු විශේෂ ගැටළු

| අනු අංකය | යෝජනාව | තීරණය |
|---|---|---|
| 01. | අම්පාර දිස්ත්‍රික්කයේ ඉරක්කාමම් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පිහිටි එරගම උළු කර්මාන්ත ශාලාවේ වත්මන් ප්‍රගතිය සහ ඉදිරි වැඩකටයුතු පිළිබඳව විමසා බැලීම. | එරගම උළු කර්මාන්ත ශාලාවේ කළමණාකරු දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු රැස්වීම සඳහා සහභාගි නොවූ හෙයින් සාකච්ඡා නොකරන ලදි. |
| 02. | අම්පාර නගරයේ පදික වෙළඳාමේ යෙදී සිටින වෙළඳ මහතුන් සඳහා වෙළඳ මධ්‍යස්ථානයක් ඉදිකිරීමට එම පදික වෙළඳ සැල පිටුපස පිහිටා ඇති ඉඩම් කොටස ලබා ගෙන ඊට අවශ්‍ය ඉදිරි කටයුතු කිරීම සඳහා අනුමැතිය ලබා ගැනීම. | මේ වන විට අදාල ඉඩම් කොටස නිදහස් කර ගෙන ඇති බවත් වෙළඳ සංකීර්ණ ඉදිකිරීමේ ව්‍යාපෘතිය රාජ්‍ය පෞද්ගලික හවුල්කාරීත්වයෙන් යා යුතුව ක්‍රියාත්මකව කිරීමට සැලසුම් කර ඇති බවත්, නියෝජ්‍ය අධ්‍යක්ෂ, නාගරික සංවර්ධන අධිකාරිය විසින් දන්වන ලදි.<br>අදාල වෙළඳ සංකීර්ණයේ පහත මාලය ඉදිකිරීම් තම වියදමින් සිදුකිරීමට පදික වෙළඳාමේ යෙදී සිටින වෙළඳමහතුන් එකඟ වී ඇති බැවින් ඒ පිළිබඳව අවධානය යොමු කරමින් කඩිනමින් මෙම ව්‍යාපෘතිය ආරම්භ කරන ලෙසට සභාපතිතුමන් විසින් නියෝජ්‍ය අධ්‍යක්ෂක වෙතට දන්වන ලදි. |
| 03. | මැතක දී A ශ්‍රේණි ගතකර ඇති පොතුවිල් මූලික රෝහලට අදාල මානව හා භෞතික සම්පත් ලබාදීම. | මෙහි දී පොතුවිල් රෝහල සඳහා අවශ්‍ය ගිලන් රථය නැගෙනහිර පළාත් සෞඛ්‍ය අමාත්‍යාංශ ලේකම් අනුමැතිය ලබා ගැනීමෙන් පසු නැවත ලබා දීමට කටයුතු කරන බව ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ, කල්මුණ විසින් ප්‍රකාශ කල අතර මෙම රෝහල සඳහා වෛද්‍ය අධිකාරිවරයෙකු හා විශේෂඥ වෛද්‍යවරයෙකු ලබා ගැනීමට අවශ්‍ය කටයුතු කරන බව ලේකම්, නැගෙනහිර පළාත් සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් ප්‍රකාශ කරන ලදි. |
| 04. | අක්කරපත්තු අධ්‍යාපන කලාපය තුල ඉංග්‍රීසි ගුරුවරු අතිරික්තව සිටින අතර පොතුවිල් අධ්‍යාපන කොට්ඨාසයේ ඉංග්‍රීසි විෂය සඳහා ගුරු පුරප්පාඩු පැවතීම. | අක්කරපත්තුව කලාපය තුල ගුරු අතිරික්තයක් නොමැති බවත් ඉදිරියේ දී බඳවා ගැනීමට නියමිත විද්‍යාපීඨ ගුරුවරුන්ගෙන් මෙම පුරප්පාඩු පිරවීමට අවශ්‍ය පියවර ගන්නා බවත් ලේකම්, නැගෙනහිර පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් කමිටුවට දන්වන ලදි. |
| 05. | ඔලුවිල් අෂ්රොෆ් නගර් සහ සම්මන්තුර යන ප්‍රදේශවල අලිමිනිස් ගැටුම වැලැක්වීමට අදාල පියවර ගැනීම. | විදුලි වැට මගින් මෙම ප්‍රශ්නය ආවරණය කිරීමට නොහැකි බව වනජීවී දෙපාර්තමේන්තුව මගින් දන්වන ලදි.<br>ගොයම් කපන කාලයට අලි තර්ජනය වැඩි බැවින් එම කාලයට බුද්ධංගල අභය භූමියෙන් වන අලි වෙල්යායට පැමිණීම නතර කිරීමට පියවර ගන්නා ලෙසට ගරු. සභාපතිතුමන් විසින් වනජීවී දෙපාර්තමේන්තුව වෙතට දැනුම් දෙන ලදි. |
| 06. | 2025 වර්ෂයේදී අම්පාර දිස්ත්‍රික්කයේ ක්‍රියාත්මක කිරීමට නියමිත ඩිජිටල් උප්පැන්න සහතික නිකුත් කිරීමේ වැඩසටහන මේ වසරේ සිට ආරම්භ කිරීමට අවශ්‍ය සම්පත් දායකත්වය ලබා ගැනීම. | කඩිනමින් අවශ්‍ය භෞතික සම්පත් සම්පූර්ණ කරගනිමින් මෙම වැඩසටහන ආරම්භ කිරීමට අවශ්‍ය පියවර ගන්නා බව දිසාපතිතුමන් විසින් දන්වන ලදි. |
| 07. | කොණ්ඩුවටුවාන යුධ හමුදා කඳවුර භාරයේ පවතින පොලිස් සේවස්ථ පුහුණු මධ්‍යස්ථානයට යාබඳව පවතින ගොඩනැගිලි 04 , අම්පාර පොලිස් සේවස්ථ පුහුණු ආයතනයේ පුහුණු කටයුතු සඳහා ලබාදීම. | මේ පිළිබඳව පොලිස් සේවස්ථ පුහුණු ආයතනය සමඟ සාකච්ඡා කර එම ගොඩනැගිලි පුහුණු කටයුතු සඳහා ලබා දීමට අවශ්‍ය කටයුතු සිදු කරන බවට යුධ හමුදාව මගින් දන්වන ලදි. |

| | | |
|---|---|---|
| 08. | කල්මුණ ප්‍රදේශයේ සිට කච්චේරිය ඇතුළු අම්පාර නගරයේ පිහිටි කාර්යාලවලට පැමිණෙන නිලධාරින්ගේ ප්‍රවාහන පහසුව සඳහා ශ්‍රී ලංකා ගමනා ගමන මණ්ඩලයට අයත් බස්රථයක් සේවයට යොදා ගැනීම. (මෙම සේවාව කල්මුණ, නීලාවනෙයි ප්‍රදේශයේ සිට පෙ.ව. 7.40ට ආරම්භ කිරීමට කටයුතු කල යුතුය.) | සැලසුම් කර ඇති ධාවන කාලසටහන් පිළිබඳව සාකච්ඡා කර තීරණයක් ගෙන දිස්ත්‍රික් ලේකම් වෙත දැනුම් දෙන බවට ගමනා ගමන මණ්ඩලය මගින් දන්වන ලදි. |
| 09. | බුදුරාපොත රඹකැන්ඔය අලිවැට ඉදිකිරීම සඳහා කැළය එළි කිරීම සිදුකර වර්ෂ 1 1/2 කට අධික කාලයක් ගත වුවද එහි වැඩ මෙතෙක් ආරම්භ කිරීමට නොහැකි වීම. | මෙම වසරේ සැලැස්මට මෙම ව්‍යාපෘතිය ඇතුලත් කර ඇති බවත් නමුත් ප්‍රතිපාදන නොලැබුණු බවත් මැයි මාසය පමණ වන විට ප්‍රතිපාදන ලැබිය හැකි බවත් වනජීවී දෙපාර්තමේන්තුව මගින් දන්වන ලදි. |
| 10. | වාචින්න, අඹගහවැල්ල, නාමල්ඔය දක්වා යන මාර්ගය මීට වසර 02කට පෙර වැඩ ආරම්භ කර ඇතත් එහි කොටසක ABC දමා ඇති නමුත් එය කාපට් හෝ තාර දමා ආවරණය කර නොමැත. එම මාර්ගයේ ධාවනය වන රථ වාහන නිසා ඇති වන දූවිල්ල නිසා ජනතාව සෞඛ්‍ය ගැටළු වලට මුහුණ දීම. | ව්‍යාපෘති ඉදිකිරීම් තාවකාලිකව නවතා ඇති බවත් නැවත මාර්ග ප්‍රතිසංස්කරණ සඳහා ප්‍රතිපාදන අප්‍රේල් මාසය තුල ලැබිය හැකි බවත් ඒ වන තුරු ක්‍රියාමාර්ගයක් ගැනීමට නොහැකි බවත් මාර්ග සංවර්ධන අධිකාරිය මගින් දැනුම් දෙන ලදි.<br>විකල්ප පිළිතුරක් ලෙස පවතින දූවිලි තත්ත්වය අවම කිරීමට බවුසර් මගින් මාර්ගයේ ජලය ඉසීමට නාමල්ඔය ප්‍රාදේශීය සභාවෙන් අවශ්‍ය කටයුතු සිදු කර දෙන ලෙස අම්පාර ප්‍රාදේශීය ලේකම් විසින් ඉල්ලීම් කරන ලදි. |
| 11. | LDSP වැඩසටහන යටතේ වෙළඳ සංකීර්ණයක් ඉදිකිරීම සඳහා නින්දවූර් පැරණි ප්‍රාදේශීය සභා පරිශ්‍රය නිදහස් කර ගැනීම. ( නින්දවූර් පැරණි ප්‍රාදේශීය සභා පරිශ්‍රයේ ස්ථාපිත කර ඇති යුධ හමුදා කඳවුර ඉවත් කිරීම) | මෙම ව්‍යාපෘතිය සඳහා රු.මිලියන 6ක ප්‍රතිපාදන නිදහස් වී ඇති බවත් ජුනි මාසය වන විට ඉදිකිරීම් අවසන් කල යුතු බවත් සහකාර පලාත් පාලන කොමසාරිස් විසින් පවසන ලදි.<br>එම පරිශ්‍රය තුල ස්ථාපිත කර ඇති 18වන රෙජිමේන්තුවේ විජයබාහු යුධ හමුදා කඳවුර ඉවත් කර ගැනීමට කටයුතු කරන බව මල්වත්ත 24 වන සේනාංකයේ සේනාංකාධිපති මේජර් ජනරාල් විපුල චන්ද්‍රසිරි මහතා විසින් දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුව වෙත දන්වන ලදි. |
| 12. | වාර්ෂික ස්ථාන මාරුවීම් අනුව අම්පාර නගර සභාව ඇතුලු අනෙකුත් පළාත් පාලන ආයතන සඳහා ස්ථාන මාරුවීම් ලැබූ නිලධාරින් අදාල කාර්යාල වෙත නිදහස් නොකිරීම සම්බන්ධව. | පළාත් පාලන මැතිවරණය හේතුවෙන් ස්ථාන මාරුවීම් ක්‍රියාත්මක කිරීම් තාවකාලිකව අත්හිටුවීමට සිදු වූ බවත් කඩිනමින් නැවත ස්ථාන මාරුවීම් ක්‍රියාත්මක කිරීම සිදු කරන බවත් නැගෙනහිර පලාත් ප්‍රධාන ලේකම් මගින් දැනුම් දෙන ලදි. |
| 13. | අම්පාර නගර සභාවේ පිරිස් බල තක්සේරු වාර්තාවේ සඳහන් මහජන සෞඛ්‍ය පරික්ෂක පුරප්පාඩුව සඳහා වසර ගණනාවක සිට ඉල්ලුම් කළ ද මේ වන තෙක් මහජන සෞඛ්‍ය පරික්ෂකවරයෙකු අනුයුක්ත නොකිරීම සම්බන්ධව. | මෙම ගැටළුව කඩිනමින් නිරාකරණය කරන ලෙසට නැගෙනහිර පලාත් ප්‍රධාන ලේකම්ට හා නැගෙනහිර පලාත් සෞඛ්‍ය අමාත්‍යාංශයේ ලේකම් වෙත ගරු සභාපතිතුමන් විසින් දැනුම් දෙන ලදි. |
| 14. | මහඔය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ වැලි හා කළුගල් කැනීම් බලපත්‍ර දීර්ඝ කර ගැනීමට භූ විද්‍යා හා පතල් කැනීම් කාර්යංශයේ කටයුතු නොකිරීම | කළුගල් කැනීම් සම්බන්ධ බලපත්‍ර නිකුත් කිරීමේ ප්‍රමාදයක් පැවතුන ද මේ වන විට නැගෙනහිර පලාත තුල අවශ්‍යතාවයට අනුව දී ඇති බලපත්‍ර ප්‍රමාණය නිකුත් කර අවසන් බවත්, මෙතෙක් නිකුත් කර ඇති වැලි/ කළුගල් බලපත්‍ර සම්බන්ධව තාක්ෂණික අධීක්ෂණයක් සිදුකරමින් පවතින බවත් එය අවසන් වූ පසු ඉදිරියේ දී කළුගල් හා වැලි බලපත්‍ර නිකුත් කිරීමට හැකියාව ඇති බවත් භූ විද්‍යා හා පතල් කැනීම් කාර්යංශය මගින් දැනුම් දෙන ලදි. |

| | | |
|---|---|---|
| 15. | අම්පාර නගර සභාව සතු එච්.එම්. වීරසිංහ ක්‍රීඩාංගණය, සෙනරත් සෝමරත්න ක්‍රීඩාංගණය, තානායම, නගර ශාලාව යන ස්ථානයන්හි උත්සව සහ වැඩසටහන් පවත්වන අවස්ථාවන්වලදී ශබ්ද විකාශන යන්ත්‍ර වලින් නිකුත් වන ශබ්දය උසාවියේ කටයුතු වලට බාධාවක් වන බැවින් එයට නිසි විසඳුමක් ලබා ගැනීම. | මේ සඳහා අම්පාර ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුවේ දී එකඟ වූ පරිදි ගොඩනැගිල්ල වායු සමීකරණය කිරීම සම්බන්ධව අධිකරණ රෙජිස්ටාර් සමඟ සාකච්ඡා කරන බවට දිසාපතිතුමන් විසින් දන්වන ලදී.<br><br>එමෙන්ම මේ සඳහා වන දීර්ඝකාලීන විසඳුමක් ලෙස උසාවිය පවතින ගොඩනැගිල්ල වෙනත් සුදුසු ස්ථානයකට මාරු කිරීම පිළිබඳ යෝජනාවක් දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුව මගින් අධිකරණ අමාත්‍යාංශය කිරීම වෙත යොමු කිරීම සුදුසු බවට වැඩිදුරටත් තීරණය විය. |
| 16 | රජය විසින් නීත්‍යානුකූලව ඉඩම කච්චේරි පවත්වා පර්චස් 10 ක බිම් කොටස් ජනතාව වෙත ලබා දුන්නද නාගරික සංවර්ධන අධිකාරියේ පනතට අනුව නේවාසික බිම් කොටසක් සඳහා පර්චස් 15 ක බිම් කොටසක් පැවතිය යුතු බැවින් අප ආයතනය මගින් අදාල අනුමත කිරීම සිදු කිරීමේදී පවතින ගැටළුව නිරාකරණය කර ගැනීම. | ගැසට් කිරීමට කටයුතු සූදානම් කර ඇති අම්පාර නගර සංවර්ධන සැලැස්ම තුල පෙර පැවති පර්චස් 15 සීමාව පර්චස් 10 දක්වා අඩු කර ඇති බව නියෝජ්‍ය අධ්‍යක්ෂ, නාගරික සංවර්ධන අධිකාරිය මගින් දැනුම් දෙන ලදී. |
| 17 | පහත් බිම් හා වගුරුබිම් ආශ්‍රිත ප්‍රදේශවල ක්‍රමවත් සංවර්ධනයක් ඇති කිරීම. | දිස්ත්‍රික්කයේ ඇතිවන ආපදා තත්ත්වයන් සඳහා ප්‍රධාන වශයෙන් මෙම කරුණු බලපාන බවත් දිස්ත්‍රික්කයේ සියලුම අදාල ආයතන මේ පිළිබඳව අවධානය යොමු කරන ලෙසත් සහකාර අධ්‍යක්ෂ ආපදා කළමණාකරණ මධ්‍යස්ථානය විසින් කමිටුව දැනුවත් කරන ලදී. |
| 18 | පොදු මහජනතාව අනවසර පදිංචි වීම හේතුවෙන් ඇතිවන ආපදා අවම කිරීම. | මෙහිදී ගරු පා.ම. ඒ.එල්.එම්.අතාවුල්ලා මැතිතුමන් විසින් අක්කරපත්තු සෙම්බුකලපු ප්‍රදේශයේ අනවසර ලෙස කුඹුරු ඉඩම් ගොඩකිරීම නිසා ඇති වී ඇති බරපතල ආපදා තත්ත්වයන් පිළිබඳව පැහැදිලි කරන ලදී. |
| 19 | රක්ෂිත ප්‍රදේශ ආරක්ෂා කිරීම හා නඩත්තු කිරීම. | මේ සම්බන්ධව පවතින ගැටළු සහගත තත්ත්වයන් අධීක්ෂණය කිරීමට ඉදිරි සති 02 තුල දිසාපතිතුමා ප්‍රමුඛ කමිටුවක් පත්කර අදාල සීමා ලකුණු කිරීම හා ඇල මාර්ගයේ රොන්මඩ ඉවත්කිරීම සම්බන්ධව විසඳුම් ලබා ගැනීම සුදුසු බව ගරු සභාපතිතුමන් විසින් දැනුම් දෙන ලදී. තව ද පරිසරයට හානියක් වන නීති විරෝධී වැලි බලපත්‍ර අහෝසි කිරීමේ බලතල වාරිමාර්ග දෙපාර්තමේන්තුවට පවතින බැවින් එය ක්‍රියාත්මක කරන ලෙසට ද දන්වන ලදී. |
| 20 | මානව හිමිකම් කොමිසන් සභා දිස්ත්‍රික් කාර්යාලය, ආණ්ඩුකාර කාර්යාලය, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය යන ආයතන වල එකඟතාව මත කරංගාව ග්‍රා/ නි වසමේ පිහිටි දැනට මානව හිමිකම් කොමිසන් සභා කාර්යාල භූමියේ පිහිටි ගොඩනැගිලි අලුත් වැඩියා කර එය "සෙනෙහස් අරණ" ළමා සංවර්ධන මධ්‍යස්ථානය ලෙස පවත්වාගෙන යාමට පරිවාස දෙපාර්තමේන්තුව වෙත එම ඉඩම පැවරීම සඳහා,මානව හිමිකම් කාර්යාලය එම ස්ථානයේ සිට යෝජිත ස්ථානය වෙත ඉවත් කිරීමට කටයුතු කිරීම. | මානව හිමිකම් කොමිෂන් සභා දිස්ත්‍රික් කාර්යාලය දැනට පවතින ගොඩනැගිල්ලෙන් ඉවත් වී එය පරිවාස දෙපාර්තමේන්තුව වෙත ලබා දිය යුතු බවට තීරණය විය. මානව හිමිකම් කොමිසන් සභා කාර්යාලය පවත්වා ගෙන යාම සඳහා ලබා දීමට යෝජිත නව ගොඩනැගිල්ල ලබා දිය හැකි බව දිසාපතිතුමා විසින් පවසන ලදී. |

| | | |
|---|---|---|
| 21 | අම්පාර දිස්ත්‍රික්කයේ උක් වගා කිරීම සඳහා අවශ්‍ය ඉඩම් හඳුනා ගැනීම. | මෙහිදී ගල්ඔය වැවිලි සමාගම විසින් වෙනත් සමාගමක් වෙත දිස්ත්‍රික්කයේ උක්වගා කිරීම සඳහා අවසර ලබා නොදෙන ලෙස දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවෙන් ඉල්ලීම් කරන ලදි. පවතින නීතිරීති අනුව රජයේ ඉඩම් මේ සඳහා ලබා නොදෙන බව ගරු සභාපතිතුමන් විසින් දන්වන ලදි. |
| 22 | අස්වැන්න නෙලන කාලය තුල හා අනෙකුත් කාලවල වනඅලි තර්ජනය වැඩිවී ඇති බැවින් එය අවම කිරීමට සුදුසු ක්‍රියාමාර්ග ගැනීම. | ගොයම් කපන කාලයට අලි තර්ජනය වැඩි බැවින් එම කාලයට අලි වෙල්යායට පැමිණීම නතර කිරීමට පියවර ගන්නා ලෙසට ගරු.සභාපතිතුමන් විසින් වනජීවි දෙපාර්තමේන්තුවට දැනුම් දීමෙන් පසු ඒ සඳහා එකඟතාවය පල කරන ලදි. |
| 23 | අක්කරපත්තු මහනගර සභා ප්‍රදේශය තුල සිදුකර ඇති අනවසර ඉදිකිරීම් හේතුවෙන් ඇති වී ඇති ගංවතුර අවදානම් තත්ත්වය පිළිබඳව. | 19 වන කරුණේ දී සාකච්ඡා කරන ලදි. |
| සාකච්ඡා කරන ලද අමතර යෝජනා | | |
| 24 | දේශීය වෛද්‍ය අමාත්‍යාංශය හා නැගෙනහිර පළාත් සභාව ඒකාබද්ධව අක්කර 50 ක අභයභූමි ප්‍රදේශයක් ඖෂධ වගාවක් සිදුකිරීම සඳහා මහඔය ප්‍රදේශයෙන් ඉඩම් නිදහස් කරගැනීම. | මේ සම්බන්ධයෙන් අවශ්‍ය සොයාබැලීම් සිදුකරන බව මහවැලි අධිකාරිය, රඹකැන්ඔය, නේවාසික ව්‍යාපෘති කළමනාකරු විසින් දන්වන ලදි. |
| 25 | අම්පාර දිස්ත්‍රික්කයේ විහාරස්ථාන ආගමික ස්ථාන හා පුරාවිද්‍යා ස්ථාන සඳහා පූජා භූමි ඔප්පු ලබා දීමට අවශ්‍ය කටයුතු කඩිනම් කරවීම. | ඊලග දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේදී සාකච්ඡා කිරීමට තීරණය විය. |
| 26 | අක්කරෙයිපත්තු කෝවිල හා විහාරස්ථානය අසල ඇති මස් හා මාළු කඩ එම ස්ථානයෙන් ඉවත් කර සුදුසු ස්ථානයක ස්ථානගත කිරීම. | එම ස්ථානයේ මස් කඩ නොමැති බව අක්කරපත්තු මහනගර සභාවේ නගරාධිපතිතුමන් විසින් දන්වන ලද අතර ස්ථාපිත කර ඇති මාළු කඩ ආවරණය කර තැබීමට අවශ්‍ය කටයුතු සිදුකරන බව ගරු පා.ම. ඒ.එල්.එම්.අතාවුල්ලා මැතිතුමන් විසින් පවසන ලදි. |

**11. ස්තූති කථාව-** දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු සභාපති දිගාමඩුල්ල දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු ඩබ්.ඩී.වීරසිංහ මැතිතුමා විසින් පැමිණි සිටි සියලුදෙනාට ස්තූතිය පළකර රැස්වීම අවසන් කරන ලදි.

ජේ.එම්.ඒ. ඩග්ලස් ,
දිස්ත්‍රික් ලේකම්
අම්පාර

ජේ.එම්.ඒ. ඩග්ලස්
දිස්ත්‍රික් ලේකම්/දිසාපති
අම්පාර දිස්ත්‍රික්කය

ඇමුණුම I

දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු රැස්වීම,අම්පාර- 2023.02.28

සහභාගීත්ව ලේඛනය

| අනු අංකය | නම | තනතුර | අමාත්‍යාංශය/දෙපාර්තමේන්තුව/ ආයතනය |
|---|---|---|---|
| 1 | ගරු ඩී. වීරසිංහ මහතා | ගරු පාර්ලිමේන්තු මන්ත්‍රී /දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු සභාපති | |
| 2 | අනුරාධා යහම්පත් මැතිණිය | ආණ්ඩුකාරවර | ආණ්ඩුකාර ලේකම් කාර්යාලය |
| 3 | ගරු. විමලවීර දිසානායක මහතා | ගරු පාර්ලිමේන්තු මන්ත්‍රී | |
| 4 | ගරු. ඒ.එල්.එම්. අතාවුල්ලා මහතා | ගරු පාර්ලිමේන්තු මන්ත්‍රී | |
| 5 | ගරු ෆයිසල් කාසිම් මහතා | ගරු පාර්ලිමේන්තු මන්ත්‍රී | |
| 6 | ගරු. එච්.එම්.එම්. හාරිස් මහතා | ගරු පාර්ලිමේන්තු මන්ත්‍රී | |
| 7 | ගරු එස්.එම්.එම්.මුෂාරෆ් මහතා | ගරු පාර්ලිමේන්තු මන්ත්‍රී | |
| 8 | ගරු තිලක් රාජපක්ෂ මහතා | ගරු පාර්ලිමේන්තු මන්ත්‍රී | |
| 9 | ගරු ටී කලෛඅරසන් මහතා | ගරු පාර්ලිමේන්තු මන්ත්‍රී | |
| 10 | ආර්.එම්.පී.එස්.රත්නායක මහතා | පළාත් ප්‍රධාන ලේකම් | ප්‍රධාන ලේකම් කාර්යාලය (නැගෙනහිර පළාත) |
| 11 | ජේ.එම්.ඒ.ඩග්ලස් මහතා | දිසාපති/දිස්ත්‍රික් ලේකම් | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, අම්පාර |
| 12 | ජේ.ජේ.මුරලිදරන් මිය | ලේකම් | සෞඛ්‍ය අමාත්‍යාංශය - නැ.ප. |
| 13 | අයි.කේ.ජී.මුතුබණ්ඩා මහතා | ලේකම් | කෘෂිකර්ම අමාත්‍යාංශය |
| 14 | එච්.ඊ.එම්.ඩබ්.ජී.දිසානායක මයා | ලේකම් | අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය |
| 15 | එන්.තමිල්වෙල්වම් මහතා | නියෝජ්‍ය ප්‍රධාන ලේකම්(සැලසුම්) | පළාත් සැලසුම් කාර්යාලය |
| 16 | වී. ජෙගදීසන් මහතා | අතිරේක දිස්ත්‍රික් ලේකම් | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, අම්පාර |
| 17 | එම්.අයි.එම්.මුස්තාෆා මයා | ප්‍රධාන ගණකාධිකාරී | ප්‍රධාන ලේකම් කාර්යාලය (නැගෙනහිර පළාත |
| 18 | වී.ගෞරිතරන් මයා | අධ්‍යක්ෂ-සැලසුම් | පළාත් මාර්ග අමාත්‍යාංශය |
| 19 | කේ.යෝගනාතන් මයා | කාර්මික නිලධාරී | මාර්ග සංවර්ධන අධිකාරිය |
| 20 | එස්.එල්.ආදම්බාවා මහතා | ප්‍රධාන ගණකාධිකාරී | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, අම්පාර |
| 21 | එච්.බී.අනීස් මහතා | නියෝජ්‍ය සැලසුම් අධ්‍යක්ෂ | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, අම්පාර |
| 22 | ඒ.අරුණනත් මිය | ජ්‍යෙෂ්ඨ ඉංජිනේරු | කෘෂිකාර්මික අංශ නවීකරණ ව්‍යාපෘතිය |
| 23 | එස්.සුදාහරන් මයා | අධ්‍යක්ෂ | ධීවර අංශය-කෘෂිකර්ම අමාත්‍යාංශය |
| 24 | ජී.කේ.සී.කරුණාරත්න මයා | බලාත්මක කිරීමේ නිලධාරියා | නාගරික සංවර්ධන අධිකාරිය |
| 25 | පී.උදයචන්ද්‍රන් මයා | ප්‍රාදේශීය කළමණාකරු | පොල් වගා මණ්ඩලය |
| 26 | ඩබ්.ඒ.ජේ.ආර්.ප්‍රනාන්දු මයා | සහකාර අධ්‍යක්ෂ | දිස්ත්‍රික් ජලජීවී වගා ව්‍යාප්ති කාර්යාලය |
| 27 | නිමලරාජන් මයා | නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ | පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව |
| 28 | ඊ.ඩී.ඩී. ලක්මාල් මයා | විධායක ඉංජිනේරු | මාර්ග සංවර්ධන අධිකාරිය |
| 29 | එච්.එම්.පී.ජයරත්න මයා | ISA | අධ්‍යාපන |

| | | | |
|---|---|---|---|
| 30 | එච්.එල්.පී.එස්.කුමාර මයා | VCM | කෘෂිකර්ම අමාත්‍යංශය-නැගෙනහිර පලාත |
| 31 | ජ්.එම්.ජ්.කුමාරි මිය | ප්‍රාදේශීය ලේකම් | දමන |
| 32 | සඳරුවන් අනුරුද්ධ මයා | ප්‍රාදේශීය ලේකම් | අම්පාර |
| 33 | බී.වී.එස්.ගුණසේන මයා | ප්‍රාදේශීය ලේකම් | පදියතලාව |
| 34 | එම්.එම්.අස්මි මයා | ප්‍රාදේශීය ලේකම් | සායින්දමරුදු |
| 35 | එම්.අයි.ෆර්නාස් මයා | ප්‍රාදේශීය ලේකම් | පොතුවිල් |
| 36 | එම්.ජ්.ලාල් කුමාර මයා | SPO | DPCCS-BP |
| 37 | එෆ්.නහීජා මිය | සහකාර ප්‍රාදේශීය ලේකම් | අඩ්ඩාලච්චේන |
| 38 | ටී.එම්.එම්.අන්සර් මයා | ප්‍රාදේශීය ලේකම් | අක්කරපත්තුව |
| 39 | වෛද්‍ය එන්.බී.එම්.ෆෙරෝස් මිය | වෛද්‍ය නිලධාරි (සැලසුම්) | ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලය, අම්පාර. |
| 40 | ආර්.බී.එම්.මහීර් මයා | කලමණාකරණ සේවා නිලධාරි | ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලය, අම්පාර. |
| 41 | කේ.තදිසමූර්ති මයා | ජ්‍යෙෂ්ඨ මැනුම් නිලධාරි | මැනුම් දෙපාර්තමේන්තුව |
| 42 | ඩී.එම්.ජයවර්ධන මයා | පරිපාලන නිලධාරි | ශ්‍රී ලංගම |
| 43 | එම්.එම්.ඩී.එස්.එන්. පෙරේරා මයා | COO | ගල්ඔය වැවිලි දෙපාර්තමේන්තුව |
| 44 | එන්.නවනීතරාජා මයා | ප්‍රාදේශීය ලේකම් | ලාහුගල |
| 45 | ජේ. ලියාකත්අලි මයා | ප්‍රාදේශීය ලේකම් | කල්මුණ |
| 46 | තිළිණ වික්‍රමරත්න මයා | ප්‍රාදේශීය ලේකම් | මහඔය |
| 47 | එස්.එල්.මොහොමඩ් මයා | ප්‍රාදේශීය ලේකම් | සම්මන්තුර |
| 48 | ආර්.අබේරත්න මයා | දිස්ත්‍රික් සහකාර අධ්‍යක්ෂ | ධීවර දෙපාර්තමේන්තුව (පලාත්) |
| 49 | නිශාන්ත ජයතුංග මයා | නියෝජ්‍ය ප්‍රාදේශීය ව්‍යාපෘති කලමණාකරු | මහවැලි අධිකාරිය. |
| 50 | ඩබ්.කේ.එම්.එස්.පී.බණ්ඩාර මයා | නියෝජ්‍ය අධ්‍යක්ෂ, | කාර්මික සංවර්ධන මණ්ඩලය |
| 51 | එල්.පී.චාමිනි සෝමදාස මිය | ගොවිජන සංවර්ධන සහකාර කොමසාරිස් | ගොවිජන සංවර්ධන දිස්ත්‍රික් කාර්යාලය |
| 52 | එස්.පී.එස්.ජයතිස්ස මයා | නියෝජ්‍ය අධ්‍යක්ෂ | නාගරික සංවර්ධන අධිකාරිය |
| 53 | කේ.ඩී.යූ.කුමාර මයා | පොලිස් පරීක්ෂක | පොලිස් ස්ථානය අම්පාර. |
| 54 | එම්.අයි.ෆයාස් මයා | සංවර්ධන නිලධාරි | ප්‍රාදේශීය සභාව |
| 55 | එස්.එන්.එම්. අෂ්රත් මයා | LGA | ප්‍රාදේශීය සභාව |
| 56 | ඉංජි.කපිල ජේ. පෙරේරා මයා | ප්‍රාදේශීය කලමණාකරු | ජාතික ජල සම්පාදන දෙපාර්තමේන්තුව |
| 57 | එස්.ජී.වී.යූ.නාරායන මයා | DSDO | ක්‍රීඩා දෙපාර්තමේන්තුව |
| 58 | එන්.මනිවන්නන් මහතා | පළාත් පාලන කොමසාරිස් | නැ.ප. ත්‍රිකුණාමලය |
| 59 | එස්.සතරසිංහ මයා | සහකාර අධ්‍යක්ෂක | කෘෂි රක්ෂණ මණ්ඩලය |
| 60 | එච්.පී.එස්.තිලකරත්න | ප්‍රාදේශීය ව්‍යාපෘති කලමණාකරු | මහවැලි අධිකාරිය, රඹකැන්ඔය |
| 61 | ජේ.ජ්.පී.එන්.ජයසිංහ මයා | නියෝජ්‍ය ප්‍රාදේශීය ව්‍යාපෘති කලමණාකරු | මහවැලි අධිකාරිය, රඹකැන්ඔය |
| 62 | එම්.එෆ්.ජ්.සානීර් මයා | නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂ (අන්තර් පලාත්) | කෘෂිකර්ම දෙපාර්තමේන්තුව (අන්තර් පලාත්) |
| 63 | එම්.එස්.එම්.අන්සාර් මයා | සහකාර කම්කරු කොමසාරිස් | කම්කරු කාර්යාලය, අම්පාර. |
| 64 | ආර්.ඥාණසෙල්වම් මයා | නියෝජ්‍ය ව්‍යාපෘති අධ්‍යක්ෂ | කාර්මික අංශ නවීකරණ ව්‍යාපෘතිය |
| 65 | කේ.පාස්කාරාදන් මයා | ඉංජිනේරු | කාර්මික අංශ නවීකරණ ව්‍යාපෘතිය |
| 66 | ආර්.එම්.ආරියදාස මයා | නියෝජ්‍ය ව්‍යාපෘති අධ්‍යක්ෂ | දේශගුණික ස්මාර්ට් වාරි කෘෂිකර්ම ව්‍යාපෘතිය |
| 67 | එම්.එම්.එන්.මුනාස් මයා | විධායක ඉංජිනේරු | මාර්ග සංවර්ධන දෙපාර්තමේන්තුව |

| | | | |
|---|---|---|---|
| 68 | ඩී.එම්.ඒ.ඩබ්.කුමාර මයා | සහකාර අධ්‍යක්ෂක වෙනුවට | වනජීවි දෙපාර්තමේන්තුව |
| 69 | එස්.ඩබ්.කුමාරසිංහ මයා | සමූපකාර සංවර්ධන සහකාර කොමසාරිස් | සමූපකාර සංවර්ධන කොමසාරිස් කාර්යාලය |
| 70 | එච්.නයිස්රෝස්කාන් මයා | සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ | අධ්‍යාපන කාර්යාලය, සම්මන්තුර |
| 71 | එම්.එස්.එම්.සෆ්රස් මයා | සමෘද්ධි අධ්‍යක්ෂ | දිස්ත්‍රික් සමෘද්ධි කාර්යාලය, අම්පාර |
| 72 | එම්.එස්.ඒ. කලීස් මයා | දිස්ත්‍රික් කෘෂිකර්ම අධ්‍යක්ෂ | දිස්ත්‍රික් ලේකම්කාර්යාලය, අම්පාර |
| 73 | ඒ.එම්.ප්‍රියන්ත බන්ඩාර මයා | දිස්ත්‍රික් පොහොර නිලධාරි | දිස්ත්‍රික් ලේකම්කාර්යාලය, අම්පාර |
| 74 | එස්.එල්.ආදම්බාවා මයා | ප්‍රධාන ගණකාධිකාරි | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, අම්පාර. |
| 75 | වෛද්‍ය උපුල් විජේනායක මයා | වෛද්‍ය අධිකාරී | මූලික රෝහල (අම්පාර) |
| 76 | එම්.ඒ.එස්.බී.උඩපමුණුව මයා | ප්‍රාදේශීය කළමනාකරු | වී අලෙවි මණ්ඩලය |
| 77 | එම්.බී.අලියාර් මයා | ව්‍යාපෘති අධ්‍යක්ෂ | මාර්ග සංවර්ධන අධිකාරිය |
| 78 | අයි.එල්.එම්.රිෆාස් මයා | ප්‍රාදේශීය සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි | ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා කාර්යාලය කල්මුණ |
| 79 | වී.ටී.සම්බන්දන් මයා | සහකාර ඉංජිනේරු | ලංකා විදුලිබල මණ්ඩලය, කල්මුණ |
| 80 | එම්.එස්.නෆීෂ් මොහොමඩ් මයා | නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ | කලාප අධ්‍යාපන කාර්යාලය, තිරුක්කෝවිල් |
| 81 | ඉංජි..ඒ.එම්.අස්මීර් මයා | විධායක ඉංජිනේරු | මාර්ග සංවර්ධන අධිකාරිය |
| 82 | එස්.ජගරාජන් මයා | ප්‍රාදේශීය ලේකම් | කාරතිවු |
| 83 | කේ.එල්.එම්.මුසම්මිල් මහතා | මුලස්ථාන ඉඩම් නිලධාරි | පලාත් ඉඩම් කාර්යාලය |
| 84 | ඒ.එල්.අයි.හානු මිය | ඉඩම් කොමසාරිස් | ඉඩම් කොමසාරිස් කාර්යාලය,අම්පාර |
| 85 | ආර්.එම්.සමරකෝන් මයා | සභාපති | ලාහුගල ප්‍රාදේශීය සභාව |
| 86 | ඒ.එම්.නෞෆිර්දීන් මයා | සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ | අධ්‍යාපන දෙපාර්තමේන්තුව |
| 87 | කේ.ශිවකුමාර් මයා | දිස්ත්‍රික් සමුද්‍රීය පරිසර නිලධාරි | සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය |
| 88 | ආර්.එම්. විජයපාල මයා | දිසා වන නිලධාරි | වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව. අම්පාර. |
| 89 | එස්.රංගනාදන් මයා | ප්‍රාදේශීය ලේකම් | නාවිදන්වෙලි |
| 90 | ඒ.එම්.අබ්දුල් ලතීෆ් මයා | ප්‍රාදේශීය ලේකම් | නින්දවූර් |
| 91 | ටී. සිවසුබ්‍රමනියම් මයා | විධායක ඉංජිනේරු | මාර්ග සංවර්ධන අධිකාරය |
| 92 | ඩී.එම්.එස්.බී.දිසානායක මයා | නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂ | කෘෂිකර්ම දෙපාර්තමේන්තුව (පළාත්) |
| 93 | ඒ.ඒ. ජලීල් මයා | IMA | ග්‍රාමීය කර්මාන්ත දෙපාර්තමේන්තුව |
| 94 | ඒ.සුදර්ශන් මයා | සභාපති | ප්‍රාදේශීය සභාව- නාවිදන්වෙලි |
| 95 | අයි.එල්.එම්.මහීර් මයා | සභාපති | ප්‍රාදේශීය සභාව- සම්මන්තුර |
| 96 | යූ.පී.එච්.උළුහදගේ මයා | ප්‍රාදේශීය කළමණාකරු | රාජ්‍ය දැව සංස්ථාව |
| 97 | ආර්.එම්.කමලසිරි මයා | නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ | කලාප අධ්‍යාපන කාර්යාලය |
| 98 | සුදත් ගමගේ මයා | වාරිමාර්ග අධ්‍යක්ෂ | වාරිමාර්ග අධ්‍යක්ෂ කාර්යාලය, අම්පාර. |
| 99 | ජේ.ඒ.අකීල් මයා | පලාත් වාරිමාර්ග අධ්‍යක්ෂ | පලාත් වාරිමාර්ග අධ්‍යක්ෂ කාර්යාලය |
| 100 | පී.විහර්නන් මයා | වාරිමාර්ග ඉංජිනේරු | වාරිමාර්ග දෙපාර්තමේන්තුව |
| 101 | එම්.එස්.ගුනසේකර මයා | කෘෂිකර්ම උපදේශක | කෘෂිකර්ම දෙපාර්තමේන්තුව |
| 102 | ආර්. රාධිකා මිය | ව්‍යාපෘති නිලධාරි | කාර්මික අංශ නවීකරණ ව්‍යාපෘතිය |

| | | | |
|---|---|---|---|
| 103 | එම්.ජේ.සී.එම්.රියාස් මයා | සහකාර අධ්‍යක්ෂ | ආපදා කළමණාකරණ මධ්‍යස්ථානය |
| 104 | වෛද්‍ය එම්.සී.එම්.මහීර් මයා | වෛද්‍ය නිලධාරි(සැලසුම්) | ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා කාර්යාලය කල්මුණ |
| 105 | එස්.එම්.එම්.ෆාර්මි | සංවර්ධන නිලධාරි | කෘෂි අපනයන මණ්ඩලය |
| 106 | වෛද්‍ය එම්.ජේ.එම්.ෆාසි මයා | පලාත් අධ්‍යක්ෂ | සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව |
| 107 | කේ.ටී.එස්.කුමාර මයා | කෘෂිකර්ම ප්‍රධානී | ගල්ඔය වැවිලි පුද්.සමාගම |
| 108 | එච්.එම්.එම්.එච්.බණ්ඩාර මයා | විධායක නිලධාරි | නාවික හමුදාව |
| 109 | ඩී. අබේවර්ධන මයා | පොලිස් ස්ථානාධිපති | පොලිස් දෙපාර්තමේන්තුව |
| 110 | එන්.රමේෂ් මයා | ප්‍රධාන අභ්‍යන්තර විගණක | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය,අම්පාර |
| 111 | එස්.පී.සීලන් මයා | භාෂා පරිවර්තක | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය,අම්පාර |
| 112 | ඩබ්.ජේ.ඩී.පී.ගුණතිලක මයා | අණදෙන නිලධාරි | සිවිල් ආරක්ෂක බලකාය |
| 113 | ජේ.ජේ.රායක් මයා | සහකාර තාක්ෂණ නිලධාරි | ගොඩනැගිලි දෙපාර්තමේන්තුව |
| 114 | කේ.ජී නලින් පෙරේරා මයා | ASR/STF | පොලිස් දෙපාර්තමේන්තුව |
| 115 | එම්.ආර්.එම්.ෆාරිස් මයා | භූ විද්‍යා ඉංජිනේරු | භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යංශය |
| 116 | ආර්.එම්.සිරිවර්ධන මයා | අධ්‍යක්ෂ | ජාතික තරුණ සේවා සභාව |
| 117 | උපුල් චන්ද්‍රසිරි මයා | මේජර් ජනරාල් | 24වන සේනාංකය,මල්වත්ත |
| 118 | යූ.එල්.ජේ. නසාර් මයා | පළාත් ඉංජිනේරු | පළාත් ඉංජිනේරු දෙපාර්තමේන්තුව. නැ.ප |
| 119 | ජේ.ජේ.සුදත් මයා | සභාපති | ප්‍රාදේශීය සභාව දෙහිඅත්තකණ්ඩිය |
| 120 | පී.රාසමෝහන් මයා | ප්‍රධාන ඉංජිනේරු | මාර්ග සංවර්ධන දෙපාර්තමේන්තුව,අම්පාර |
| 121 | එම්.එච්.ජේ. රහීම්.මයා | සභාපති | ප්‍රාදේශීය සභාව පොතුවිල් |
| 122 | වයි.එම්.එස්.එස්.යාපා මයා | නේවාසික ප්‍රාදේශීය කලමණාකරු | නේවාසික ව්‍යාපෘති කලමණාකරණ අංශය |
| 123 | එම්.අයි.ෆවුම් මයා | සහකාර අධ්‍යක්ෂ | ඉඩම් පරිහරණ |
| 124 | ජේ.පී.අයිරාංගනී මිය | දිස්ත්‍රික් කළමනාකරු | ජාතික නිවාස සංවර්ධන අධිකාරිය, අම්පාර |
| 125 | එස්.ආර්.හසන්ති මිය | කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ | කලාප අධ්‍යාපන කාර්යාලය |
| 126 | කේ.එස්.තුෂාර පෙරේරා මයා | නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂ, | නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂ කාර්යාලය, අම්පාර (බීජ) |
| 127 | එස්.උදයරාජන් මයා | සහකාර අධ්‍යක්ෂ | මධ්‍යම පරිසර අධිකාරිය, අම්පාර. |
| 128 | උදාර නානායකකාර මයා | ප්‍රාදේශීය ලේකම් | උහන |
| 129 | වෛද්‍ය ඩබ්.ජී.එස්.සංජීවනී මිය | පශු වෛද්‍ය | සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව |
| 130 | වී.පපාකරන් මයා | ප්‍රාදේශීය ලේකම් | ආලයඩිවෙම්බු |
| 131 | එම්.එස්.එස්.නජීම් මයා | කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ | කල්මුණ කලාප අධ්‍යාපන කාර්යාලය. |
| 132 | ආර්. අබිරිජිතන් මයා | ජලජීවී වගා සංවර්ධන නිලධාරී | දිස්ත්‍රික් ධීවර කාර්යාලය (නැගෙනහිර පළාත) |
| 133 | එම්.එස්.සහතුල් නජීන් මයා | කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ | කලාප අධ්‍යාපන කාර්යාලය |